# CARAT 2023 සමාප්ති අවස්ථාව

## 2023 ජනවාරි 26 වැනිදා, බ්‍රහස්පතින්දා

## ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති ජුලී චංග් මහත්මිය විසින් සමාප්ති අවස්ථාවේ පලකළ අදහස්

සුභ සන්ධ්‍යාවක් වේවා.  CARAT 2023 අභ්‍යාසයේ සාර්ථකත්වය සමරන්නට අද දින ඔබ සැම සමගින් එක්වන්නට ලැබීම මා ලැබූ වරප්‍රසාදයක් වනවා. එසේත් නැතිනම්, ඊයේ දිනයේ නෞකාවට ගොඩවැදීමට අවස්ථාව ලැබූ මාගේ දස හැවිරිදි පුතා කියූ අන්දමට කියනවා නම්, "අම්මේ මේක නියමයි!" ශ්‍රී ලංකා නාවික හමුදාපතිතුමා වන වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා මහතා, එ.ජ. නාවික හමුදාවේ 7වැනි බලඇණියේ උප අණදෙන නිලධාරී, රියර් අද්මිරාල් ජෝකින් මාර්ටිනස් ඩි පිනියොස් මහතා, USS Anchorage අණදෙන නිලධාරී, නාවික කපිතාන් ඩැනියෙල් කීලර් ඇතුළුව මෙහි සිටින ඔබ හැමදෙනාටම ස්තුතියි.

එමෙන්ම, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ගුවන් හමුදාව, USS Anchorage නෞකාවේ නිලධාරීන් සහ කාර්යමණ්ඩලය, Destroyer Squadron 7, එ.ජ. මැරීන් බලකායේ 13th Marine Expeditionary ඒකකය සහ CARAT හි සාර්ථකත්වයට දායක වූ සියළුදෙනා වෙත මගේ සුභ පැතුම් පිරිනමනවා.

CARAT යනු එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව අතර ඇති විශාලතම හමුදා සම්බන්ධවීම් වන අතර, එක්සත් ජනපදයේ අප, ඉන්දියානු සාගර කලාපයේ ආරක්ෂාව සඳහා එය ඉතා වැදගත් යැයි සලකනවා. මා මෑතකදී හොනොලුලු හි INDOPACOM වෙත සංචාරය කර ආපසු ආවා. එහිදී අප නිදහස් සහ විවෘත ඉන්දු-ශාන්තිකර කලාපයක් පවත්වාගැනීම වැදගත්වන්නේ ඇයිද යන්න ගැන සාකච්ඡා කළා- අපට සහ ශ්‍රී ලංකාව ඇතුළුව මෙම කලාපයේ අපගේ මිතුරන්ට ආර්ථික ඔරොත්තුදෙනසුළුබව, යහපාලනය සහ පොදුවේ සෞභාග්‍ය සඳහා එය වැදගත් වනවා.

කෝවිඩ්-19 හේතුවෙන් වසර කිහිපයකට මෙම අභ්‍යාසය අත්හිටුවන්නට සිදුවුවත් 2023 වර්ෂයේ දී එය නැවතත් ක්‍රියාත්මක කරන්නට අප දෙරටේ හමුදාවලට හැකිවීම ගැන මා බොහෝ සතුටු වනවා. විශේෂයෙන්ම ඒ, අපේ අද්මිරාල්වරයා සඳහන් කළාක් මෙන් එක්සත් ජනපදයත් ශ්‍රී ලංකාවත් 75 වසරක අද්විතීය මිත්‍රත්වයක්, හවුල්කාරීත්වයක් සහ ප්‍රගතියක් සමරන්නේ 2023 වර්ෂයේ දී වන නිසායි.

මේ වර්ෂයේ අපි එක්සත් ජනපදයත් ශ්‍රී ලංකාවත් අතර ශතවර්ෂයකින් තුන්කාලක් තිස්සේ පැවති ද්විපාර්ශවීය සම්බන්ධතා සමරනවා. අපට පොදු ප්‍රජාතන්ත්‍රවාදී

වටිනාකම් මත ගොඩනැගී ඇති මේ සම්බන්ධතාවය පුළුල් සහ ගැඹුරු සම්බන්ධතාවයක්.

ඒ සම්බන්ධතාවයේ දීර්ඝායුෂ සහ මෙම කලාපය සුරක්ෂිත, ආරක්ෂාව සහිත සහ සෞභාග්‍යමත් කලාපයක් බවට පත්කිරීමට අපේ ඇති අඛණ්ඩ කැපවීම සැමරීම සඳහා මේ වර්ෂයේ අපට ලැබෙන බොහෝ අවස්ථා අතරින් CARAT පළමු අවස්ථාවයි.

ත්‍රස්තවාදය, මිනිස් වෙළඳාම, සහ ඉන්දියානු සාගරයේ නීති-පාදක පිළිවෙලට තර්ජනයක් වන වෙනත් ක්‍රියාකාරකම් මැඩලීම සඳහා හමුදාවේ මූලික නිපුණතා වර්ධනය කිරීමට මේ අභ්‍යාසය හේතු වනවා.

ශ්‍රී ලංකා නාවික හමුදාවේ ගජබාහු සහ විජයබාහු යාත්‍රා මෙම අභ්‍යාසයට සම්බන්ධවනු දැකීමෙන් මා විශේෂයෙන්ම උද්‍යෝගිමත් වූවා. අලංකාර උත්සවයකින් පසුව විජයබාහු නෞකාව භාර දෙනු ලැබුවේ පසුගිය නොවැම්බර් මාසයේ යි. එක්සත් ජනපදයේ පරිත්‍යාග වන මේ නෞකා දෙකම ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ආරක්ෂාව සහ සමුද්‍රීය ස්වෛරීත්වය සඳහා අපගේ කැපවීමට සාක්ෂි දරනවා.

සමීපව මෙම අභ්‍යාසය නිරීක්ෂණය කරන්නට අවස්ථාව ලැබුණු අප, විවිධ ආකාරවලින් සම්බන්ධතා වඩාත් ශක්තිමත් කරගන්නට CARAT හරහා ලැබෙන පිටුවහල දැකීමෙන් අතිශයින් විස්මයට පත් වූවා.

උදාහරණ වශයෙන්, ස්වභාවික ආපදාවකදී ශ්‍රී ලාංකික පුරවැසියන්ට පිරිසිදු පානීය ජලය කරා ප්‍රවේශ විය හැකි බව සහතික කරන්නට අපේ හමුදාවන් ජල පවිත්‍රකරණය සම්බන්ධයෙන් පුහුණුව ලැබුවා.

හමුදා ක්ෂේත්‍රය තුළ කාන්තාවන් විසින් වැඩි වැඩියෙන් බලපෑමක් ඇති කරන විවිධ ආකාර ආමන්ත්‍රණය කරන්නට දෙරටේම හමුදා නිලධාරීන්ට අවස්ථාවක් ලබාදුන් කාන්තාවන්, සාමය සහ ආරක්ෂාව පිළිබඳ වැඩසටහනක් පවත්වන්නට අප කටයුතු කළා. ශ්‍රී ලාංකීය කාන්තා නිලධාරීන් විදේශ නාවික යාත්‍රාවක පූර්ණ වශයෙන් නැව්ගත වූ පළමු අවස්ථාව මෙයයි.

දෙරටේම සංස්කෘතික සම්ප්‍රදායන් සහ සුවිශේෂී ගීත සඳහා ගරු කරමින්, අපේ තූර්යවාදක කණ්ඩායම් එක්ව වාදනයේ නිරතවනු මා ඉතා කැමැත්තෙන් බලාසිටියා. අපේ පවුල්වල සාමාජිකයින් ද සමගින් වික්ටරි පාර්ක් හි දී දැක බලාගත් ප්‍රසංගය ඒ සතියේ මා ලැබූ සුවිශේෂී අත්දැකීමක් වූවා - ඔබ ඒ වීඩියෝ පටය දුටුවේ නැතිනම්, ටැම්බරීනය වාදන හැකියාව පෙන්වන්නටත් මට අවස්ථාවක් ලැබුනා!

එමෙන්ම, ජපාන ස්වයං ආරක්ෂක හමුදාව සහ මාලදිවයින් ජාතික ආරක්ෂක බලකාය යන මේ අභ්‍යාසයට සහභාගී වූ අපගේ අනගි හමුදා හවුල්කරුවන් සමගින් අපගේ ජාත්‍යන්තර සහයෝගිතාවය පුළුල් කරගන්නටත් අපට හැකිවූවා.

හමුදාවන් අතරේ සම්බන්ධක පටක ගොඩනංවමින්, සැබෑ හවුල්කාරීත්ව තනාගැනීම සඳහා පදනම ලෙස ක්‍රියා කරන්නේ CARAT වැනි සම්බන්ධවීම්. විශේෂයෙන්ම දුෂ්කර අවස්ථාවලදී මෙය සැබෑවක් වනවා.

අභියෝගාත්මක 2022 වර්ෂයේ එක්සත් ජනපදයෙන් ශ්‍රී ලංකාවට ලබාදිය හැකි වූ සහයේ පුළුල්බව සහ ගැඹුර පිළිබඳව මා ඉතා ආඩම්බර වනවා. ඊට විජයබාහු නෞකාව පරිත්‍යාග කිරීමත් ඇතුළත් වනවා, නමුත්, ඊට මානුෂීය සහ සංවර්ධන ආධාර වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 240ක් ලබාදීම ද ඇතුළත් වනවා. එම ආධාර, ළමයින්ට පාසලේදී ආහාර වේලක් ලැබෙන බවත්, වගා කටයුතු සඳහා ගොවීන්ට පොහොර ලැබෙන බවත් සහතික කරන්නට සහය වෙනවා.

අප දෙරට අතර ඇති සබඳතාවය ශක්තිමත් වෙමින් සහ වර්ධනය වෙමින් තිබූ සියවසකින් හතරෙන් තුනක් පමණ කාලයක් තිස්සේ අප ඒ සබඳතාවය පෝෂණය කර තිබෙනවා.

CARAT වැනි ක්‍රියාකාරකම් හරහා ඒ වර්ධනය තවදුරටත් ඉදිරියට සිදුවද්දී විදේශ රටවලින් එන සතුරු බලපෑම් සඳහා ප්‍රතිරෝධය දැක්විය හැකි, තම ස්වෛරීත්වය ආරක්ෂා කරගත හැකි, සියළුම ශ්‍රී ලාංකිකයින්ට සෞභාග්‍ය ලඟා කරගැනීමට හැකියාව ලබාදෙන ශක්තිමත් ආයතන සංවර්ධනය කරගත හැකි වඩාත් ඔරොත්තුදෙනසුළු ශ්‍රී ලංකාවක් ඇතිවනු අපට දැකගත හැකි වේවි.

ශ්‍රී ලංකා රජයේ සිටින මාගේ සගයින් සහ මිත්‍රවරුන්, ශ්‍රී ලංකාවේ හමුදාව සහ එක්සත් ජනපදයේ හමුදාව, එමෙන්ම අපගේ දීර්ඝ කාලීන මිත්‍රත්වයේ තවත් වැදගත් අවස්ථාවක් බවට මෙම අභ්‍යාසය පත්කරන්නට වෙහෙස වූ අන් හැමදෙනාත් වෙත මා යළිත් වරක් ඔබේ වෙහෙස මහන්සිය සහ කැපවීම වෙනුවෙන් ස්තුති කරනවා. හවුල්කාරීත්වය, සෞභාග්‍ය සහ ප්‍රගතිය සපිරි තවත් 75 වසරකට මා සුභ ප්‍රාර්ථනා කරනවා. ස්තුතියි.